# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

### අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන

11 පත්‍රයට අදාළ ගැටළු

**11 ශ්‍රේණිය**

**3 වන ඒකකය - අන්තර්ජාලය හා විද්‍යුත් තැපැල**

1. අ.පො.ස. (සා.පෙළ) 2016 (1-iii)

එක්තරා සමාගමක් සිය විද්‍යුත් ලේඛන, පැතුරුම්පත් සහ රූප ආචයනය කිරීම සඳහා තමන්ගේම ගොනු සේවා දායකයක් (File server) භාවිත කරයි. එම සමාගම වියදම් අඩු කර ගැනීමේ අරමුණින් තම ගොනු, ආචයනය කිරීම සඳහා වලාකුළු පරිගණනය (Cloud computing) පාදක කරගත් (මාර්ගගත) ධාවකයක් (drive) භාවිත කිරීමට තීරණය කරයි.

(a) වලාකුළු පරිගණනය පාදක කරගත් (මාර්ගගත) ධාවක භාවිත කිරීමෙන් වියදම් අඩු කර ගැනීමට අමතරව ලැබෙන තවත් **එක්** වාසියක් සඳහන් කරන්න.

(b) වලාකුළු පරිගණනය පාදක කරගත් (මාර්ගගත) ධාවක භාවිතයේ **එක්** අවාසියක් සඳහන් සඳහන් කරන්න.

2. අ.පො.ස. (සා.පෙළ) 2016 (1-vii)

Ⓟ සිට Ⓢ දක්වා වන අක්ෂරවලින් දක්වා ඇති අන්තර්ජාලයට අදාළ ප්‍රකාශ හතරක් පළමු තීරුවෙහි අඩංගු පහත වගුව සලකන්න:

| | |
|---|---|
| Ⓟ - විද්‍යුත් ලේඛනවල විශාල එකතුවක් | HTTP |
| Ⓠ - අන්තර්ජාලය හරහා විශාල ගොනු එක් පරිගණකයක සිට වෙනත් පරිගණකයකට මාරු කිරීම | DNS |
| Ⓡ - ඒකාකාරී සම්පත් නිශ්චායකයක් (URL) IP ලිපිනයකට පරිවර්තනය කිරීම | FTP |
| Ⓢ - වෙබ් පිටුවලට ප්‍රවේශ වීම සඳහා වන නියමාවලියක් (Protocol) | WWW |

පළමු තීරුවෙහි දක්වා ඇති වගන්ති දෙවැනි තීරුවෙහි දක්වා ඇති පදවලට ගළපන්න. වගන්තිවලට අදාළ අක්ෂර සහ නිවැරදි පද ඔබේ පිළිතුරු පොතෙහි ලියා දක්වන්න.

3. අ.පො.ස. (සා.පෙළ) 2016 (6 -ii)

මූලස්ථාන කාර්යාලය කොළඹ ද ශාඛා මහනුවර, මාතර සහ යාපනය යන නගරවල ද ඇති එක්තරා සමාගමක් තම ශාඛා කළමනාකරුවන්ගේ මාසික රැස්වීම වීඩියෝ සම්මන්ත්‍රණ (Vedio conferencing ) තාක්ෂණය උපයෝගී කර ගනිමින් පැවැත්වීමට තීරණය කරන ලදී.

(a) වීඩියෝ සම්මන්ත්‍රණ තාක්ෂණය උපයෝගී කර ගැනීමෙන් සමාගමට ලැබෙන **එක්** වාසියක් ලියා දක්වන්න.

(b) වීඩියෝ සම්මන්ත්‍රණ තාක්ෂණය උපයෝගී කර ගැනීම නිසා මෙම සමාගමට මුහුණදීමට සිදු විය හැකි **එක්** ගැටලුවක් ලියා දක්වන්න.

(c) ඉහත සමාගම දැනට තම සේවකයන් සමග සන්නිවේදන කටයුතු සඳහා මුද්‍රිත ලිපි සහ කෙටි ලිපි (Memos) භාවිත කරයි. සේවකයින් සමග සන්නිවේදන කටයුතු සඳහා වර්තමානයේ භාවිත කරන එම ක්‍රම වෙනුවට නවීන තාක්ෂණය භාවිත කිරීමට සමාගම තීරණය කරන ලදී. ඒ සඳහා සුදුසු පණිවිඩ යැවීමේ තාක්ෂණයක් නිර්දේශ කරන්න.

(d) වීඩියෝ සම්මන්ත්‍රණ සහ ඉහත (c) හි ඔබගේ නිර්දේශයට අමතරව, මෙම සමාගමට තම සේවකයන් සමග නවීන තාක්ෂණය භාවිතයෙන් සන්නිවේදන කටයුතු කළ හැකි වෙනත් ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

4. අ.පො.ස. (සා.පෙළ) 2017 (1-vii)

පහත වගන්ති අතුරෙන් කවරක් **සත්‍ය** හෝ **අසත්‍ය** වන්නේ දැයි හඳුනාගන්න. වගන්ති අංකය හා එහි **සත්‍ය** හෝ **අසත්‍ය** බව ලියා දක්වන්න.

① අන්තර්ජාලයට සම්බන්ධ පරිගණකයක් අනන්‍යව හඳුනාගැනීම සඳහා අන්තර්ජාල නාමාවලි ලිපිනය (IP address) භාවිත කරයි.

② දුරස්ථව පවතින පරිගණක අතර ගොනු හුවමාරුව සඳහා ගොනු තැන්මාරු නියමාවලිය (FTP) භාවිත කරයි.

③ HTML ලේඛන හුවමාරු කරගැනීම සඳහා අධි පාඨ තැන්මාරු නියමාවලිය (HTTP) භාවිත කරයි.

④ වලාකුළු (cloud) පරිගණක පරිසරයේ ඇති ගොනු සහ බහළු (files and folders) වෙත අන්තර්ජාල සබඳතාව නොමැතිව පිවිසිය හැකි ය.

5. අ.පො.ස. (සා.පෙළ)- 2017 (6 – ii )

පරිශීලකයකු විසින් 'http://www.nie.lk' වෙබ් පිටුව සඳහා පිවිසීමට යන ක්‍රියාවලියේ පියවර පහත දක්වා ඇත.

A - www.nie.lk යන වසම් නාමය IP ලිපිනයට පරිවර්තනය සඳහා වන ඉල්ලීම වසම් නාම සේවාදායකය (DNS) වෙත යවනු ලැබේ.

B - වසම් නාම සේවාදායකය මගින් 222.165.180.150 යන IP ලිපිනය නැවත එවනු ලැබේ.


C - වෙබ් අතරික්සුව මගින් HTML පිටුව විදැහු (render) කරනු ලබයි.

D - වෙබ් අතරික්සුව මගින් 'http Get' ඉල්ලීම 222.165.180.150 යන IP ලිපිනය ඇති වෙබ් සේවාදායකය වෙත යවනු ලැබේ.

E - 222.165.180.150 යන IP ලිපිනය ඇති වෙබ් සේවාදායකය, HTML දත්ත ප්‍රවාහය (data stream) ආපසු එවනු ලබයි.

F - පරිශීලකයා වෙබ් අතරික්සුව විවෘත කර 'http://www.nie.lk' ඇතුළත් කරයි.

ඉහත පියවරවලට අදාළ ක්‍රියාවලිය පහත රූපයේ දැක්වේ. එම රූපයේ ලේබල අංක ③, ④ හා ⑤ ඉහත B, D හා E නම් පියවර හා පිළිවෙළින් ගළපා ඇත. ඉතිරි පියවර රූපයේ ඇති අංකිත ලේබලවලට නිවැරදිව ගළපා ලේබල අංකය හා පියවර අක්ෂරය ලියා දක්වන්න.




6. අ.පො.ස. (සා.පෙළ) 2018 (1-vi)

පහත වම් තීරුවේ වලාකුළු පරිගණන සේවා තුනක් (Ⓐ - Ⓒ ලේබල) දී ඇති අතර, දකුණු තීරුවේ ඒ එක් එක් වර්ගය මගින් ලබාදෙන සමහර සේවා විස්තර කර ඇත (Ⓧ - Ⓩ ලේබල). මෙම තීරු දෙකෙහි අයිතම ගළපා අදාළ යුගල ලේබල මගින් ලියා දක්වන්න.

| | |
|---|---|
| Ⓐ – යටිතල පහසුකම් සේවාවක් ලෙස (Infrastructure as a Service) (IaaS) | Ⓧ – වලාකුළේ ස්ථාපනය කළ මෘදුකාංග සැපයේ [උදා: Google Docs] |
| Ⓑ – මෘදුකාංග සේවාවක් ලෙස (Software as a Service) (SaaS) | Ⓨ – මෘදුකාංග සංවර්ධනය සඳහා අවශ්‍ය සේවා පරිසරය (server environment) සැපයේ [උදා: Google App Engine] |
| Ⓒ – වේදිකාව සේවාවක් ලෙස (Platform as a Service) (PaaS) | Ⓩ – සේවාදායකයින්, ජාල, ආචයන වැනි පහසුකම් සැපයේ [උදා: Amazon Web Services (AWS)] |

7. අ.පො.ස. (සා.පෙළ)- 2018 (1-vii)

පහත (S1) සිට (S4) දක්වා ලේබල මගින් දක්වා ඇත්තේ විවිධ සන්නිවේදන ක්‍රමවේද අවශ්‍ය වන වෙනස් සංසිද්ධි හතරකි.

(S1) – බැංකු කළමනාකරුවකු ශ්‍රී ලංකාවේ සිටින අතරතුර ඉන්දියාවේ පිහිටි ඔහුගේ ප්‍රධාන කාර්යාලයේ පැවැත්වෙන රැස්වීමකට එක්වීම

(S2) – ලේකම්වරියක් ඇයගේ කළමනාකරුගේ වාර්තාවක මෘදු පිටපත (soft copy) වෙනත් නගරයක පිහිටි ශාඛාවක සේවය කරන සියලුම සේවකයින් වෙත යැවීම

(S3) – තාක්ෂණ නිලධාරියකු යන්ත්‍රය අලුත්වැඩියා කර අවසන් බව ඔහුගේ කළමනාකරු වෙත පණිවිඩයකින් දන්වා යැවීම

(S4) – අලෙවි කළමනාකරුවකු, සමාජ සේවා ව්‍යාපෘතියක ඡායාරූප, පාරිභෝගිකයන් සමග බෙදා ගැනීම (share) සහ ඔවුන්ගේ ප්‍රතිපෝෂණ, විචරණ (comments) ලෙස ලබා ගැනීම

පහත දී ඇති ලැයිස්තුවෙන් ඉහත දක්වා ඇති එක් එක් සංසිද්ධිය සඳහා **වඩාත් ම ගැළපෙන** සන්නිවේදන ක්‍රමය හඳුනාගෙන සංසිද්ධි අංකය හා හඳුනාගත් සන්නිවේදන ක්‍රමය ලියා දක්වන්න.


**ලැයිස්තුව:** {බ්ලොග් (blog), විද්‍යුත් තැපැල (email), ක්ෂණික පණිවුඩ යැවීම (instant messaging), සමාජ ජාලා (social network), වීඩියෝ සම්මන්ත්‍රණ (video conferencing)}

8. අ.පො.ස. (සා.පෙළ)- 2018 (3-ii)

(a) හා (b) කොටස්වලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් පද ලැයිස්තුව භාවිත කරන්න.

**පද ලැයිස්තුව :** {*DNS* සේවාදායකය (*DNS server*) , වසම් නාමය (*domain name*), ගොනු හුවමාරු නියමාවලිය (*FTP*), IP ලිපිනය, තැපැල් සේවාදායකය (*mail server*), සම්පතට මඟ (*path to resource*), නියමාවලිය (*protocol*), සම්පත (*resource*), *SMTP*, ආයාචිත තැපෑල (*spam mail*), අඛණ්ඩ සේවාදායකය (*streaming server*), ඉහළ මට්ටම් වසම (*top level domain*), ඒකාකාර සම්පත් නිශ්චායකය[*uniform resource locator(URL)*], වෙබ් සේවාදායකය (*web server*), ලෝක විසිරි වියමන (WWW)}

(a) Ⓟ-Ⓥ දක්වා පහත පෙන්වා ඇති ලේබල සඳහා අදාළ පද ඉහත ලැයිස්තුවෙන් හඳුනාගෙන ලේබලය ඉදිරියෙන් ලියා දක්වන්න.




(b) පහත Ⓐ - Ⓓ දක්වා පෙන්වා ඇති විස්තර එක එකක් සඳහා ගැළපෙන පදය ඉහත ලැයිස්තුවෙන් හඳුනාගෙන ලේබලය ඉදිරියෙන් ලියා දක්වන්න.

| | |
|---|---|
| Ⓐ | HTTP භාවිත කොට සේවා යෝජකයන් (clients) වෙත වෙබ් පිටු ලබා දෙයි. |
| Ⓑ | අන්තර්ජාලයේ ඇති පරිගණකයක් අනන්‍යව හඳුනා ගැනීමට උපකාරී වේ |
| Ⓒ | යවනු ලැබූ සෑම විද්‍යුත් ලිපියක්ම ලබන්නා තෙක් වූ මාවතේ ඇති මෙවැනි සේවාදායකයන් පෙළක් තුළින් ගමන් කරයි |
| Ⓓ | අනවශ්‍ය විද්‍යුත් තැපැල් පණිවිඩ |

9. අ.පො.ස. (සා.පෙළ)- 2019 (1-x)

(x) හමීඩ්, මීනා, ෂර්මා සහ ගිහාන් වෙත කමල් විද්‍යුත් තැපැල් පණිවුඩයක් යවයි. එහි විද්‍යුත් තැපැල් ශීර්ෂය පහත දක්වා ඇත.

| | |
|---|---|
| **To:** | හමීඩ්, මීනා |
| **Cc:** | ෂර්මා |
| **Bcc:** | ගිහාන් |

Ⓐ සහ Ⓑ ලෙස ලේබල කළ පහත වගන්ති දෙක **සත්‍ය (T)** හෝ **අසත්‍ය (F)** දැයි ලියා දක්වන්න. (ඔබේ පිළිතුරෙහි වගන්ති ලේබලය හා **සත්‍ය/අසත්‍ය** බව දක්වන්න.)

Ⓐ හමීඩ් තැපැල් පණිවුඩය ලබන්නකු සේ ගිහාන් ට දැකගත හැකි ය.

Ⓑ ගිහාන් තැපැල් පණිවුඩය ලබන්නකු සේ ෂර්මාට දැකගත හැකි ය.

10. අ.පො.ස. (සා.පෙළ)- 2019 (2-iii)

(iii) පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(a) පුද්ගලයකුට තම පරිගණකයේ ඇති පැතුරුම්පතක් අනවසර පිවිසීම්වලින් ආරක්ෂා කරගත හැකි ආකාරයක් ලියා දක්වන්න. (පරිගණකය අන්තර්ජාලයට සම්බන්ධව නැති බව උපකල්පනය කරන්න.)

(b) තම පරිගණකය සඳහා වාණිජමය (commercial) පැතුරුම්පත් මෘදුකාංගයක් මිලදී ගැනීමට පුද්ගලයකුට වත්කමක් නැත. ඔහුට නිතර පැතුරුම්පත් මෘදුකාංග භාවිතය අවශ්‍ය ය. එහෙත් ඒ සඳහා නිතර ICT සේවා මධ්‍යස්ථානයකට යෑමට කරදර වීමද, මුදල් ගෙවීමද ඔහුට රිසි නොවේ. ඔහුගේ පැතුරුම්පත් අවශ්‍යතා සපුරාගැනීම සඳහා ඔහුට කළ හැකි එක් දෙයක් ලියන්න.

(d) වෙබ් අඩවියකින් සන්ධාර කොටසක්, තම රචනයකට, ලිඛිත දැ සොරකමකින් (plagiarism) තොරව ශිෂ්‍යයකුට ඇතුළත් කළ හැකි ආකාරය ලියා දක්වන්න.

(e) කොළඹ කාර්යාලයක සිටින කළමනාකරුවකුට, යාපනය හා මාතර කාර්යාලවල සිටින කළමනාකරුවන් සමග වීඩියෝ සම්මන්ත්‍රණයක් අවශ්‍ය වේ. මෙම පහසුකම භාවිත කිරීම සඳහා එම ස්ථානවල තිබිය යුතු අවශ්‍යතා ලියා දක්වන්න.

11. අ.පො.ස. (සා.පෙළ)- 2019 (4 - i)

(i) Ⓐ සිට Ⓕ දක්වා ලේබල් කර ඇති හිස්තැන් සහිත වගන්ති සලකා බලන්න. පහත දී ඇති ලැයිස්තුවේ සඳහන් පද අතුරෙන් හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍යතම පද හඳුනාගන්න. එක් එක් පිළිතුර සඳහා වගන්ති ලේබලය හා අදාළ පදය ලියා දක්වන්න.

Ⓐ - අන්තර්ජාලයෙහි වසම් නාම (domain name) සහ IP ලිපින අතර සම්බන්ධතාව ........................ මගින් නිර්ණය කරනු ලබයි.

Ⓑ - අන්තර්ජාලය හරහා එක් පරිගණකයක සිට තවත් පරිගණකයකට විශාල ගොනු හුවමාරු කිරීම සඳහා ............................ භාවිත කෙරේ.

Ⓒ - විද්‍යුත් තැපැල් සේවාදායක පරිගණක අතර විද්‍යුත් තැපැල් ප්‍රවාහනය සඳහා ඉතා වැදගත් නියමාවලි (protocol) අතුරෙන් එකක් වන්නේ ........................... ය.

Ⓓ - ........................... යනු www.nie.lk යන වසම් නාමයෙහි ඉහළ මට්ටමේ වසමයි.

Ⓔ - URL නොදන්නා වෙබ් පිටු සොයාගැනීමට .......................... භාවිත කළ හැකි ය.

Ⓕ - .......................... මගින් විද්‍යුත් ලිපිනයක පරිශීලක නාමය හා වසම් නාමය වෙන් කරනු ලබයි.

**ලැයිස්තුව :** {# සංකේතය, @ සංකේතය, *DNS* සේවාව, *FTP, HTTP, ICMP, IP* ලිපිනය, *IP* සේවාව, *lk, nie.lk*, සෙවුම් යන්ත්‍ර, *SMTP, URL*}

12. අ.පො.ස. (සා.පෙළ)- 2020 (4 - i, ii)

(i) වලාකුළු පරිගණක (cloud computing) සේවාවක් වූ Saas (සේවාවක් ලෙස මෘදුකාංග, Software as a Service) භාවිත කිරීමේදී ආයතනයකට ලැබෙන වාසි **දෙකක්** ලියන්න.

(ii) P සිට Q තෙක් වූ ලේබල මගින් දැක්වෙන විස්තර, පහත දී ඇති පද ලැයිස්තුවේ නිවැරදි පදය හා ගළපා, එක් එක් පදය අදාළ ලේබලය ඉදිරියෙන් **ලේබල ⟶ පදය** ආකාරයෙන් ලියා දක්වන්න.

| ලේබලය | විස්තරය |
|---|---|
| P | අන්තර්ජාලය තුළ පවතින පරිගණකයක් අනන්‍යව හඳුනාගැනීම |
| Q | එක් පිටුවක් තවත් වෙබ් පිටුවකට සම්බන්ධ කිරීම |
| R | වසම් නාමයක් IP ලිපිනයකට පරිවර්තනය කිරීම |
| S | වෙබ් සේවාදායකය සහ වෙබ් අතරික්සුව අතර සන්නිවේදනය සඳහා භාවිත කෙරේ. |

ලැයිස්තුව: { FTP, IP ලිපිනය, Pagelink, SMTP, DNS, URL, HTTP, අධිසන්ධානය (Hyperlink)}

13. අ.පො.ස. (සා.පෙළ)- 2021 (1- vii)

(vii) Ⓟ–Ⓢ තෙක් ලේබල කරන ලද විස්තර, පහත දී ඇති පද ලැයිස්තුවේ ඇති නිවැරදි පදය හා ගළපන්න. එක් එක් ලේබලය ඉදිරියෙන් එයට ගැළපෙන පදය, **ලේබලය ⟶ පදය** ආකාරයෙන් ලියා දක්වන්න.

| ලේබලය | විස්තරය |
|---|---|
| Ⓟ | අන්තර්ජාලයේ පවතින තැපැල් සේවාදායක අතර විද්‍යුත් තැපැල් හුවමාරුව සඳහා භාවිත වේ. |
| Ⓠ | වලාකුලෙහි (cloud) ස්ථාපනය කරන ලද මෘදුකාංගවලට ප්‍රවේශය ලබා දේ. |
| Ⓡ | යැවීමට පිළියෙළ කරන ලද, එහෙත් සම්පූර්ණ නොවූ ලිපි ආචයනය සඳහා වූ ෆෝල්ඩරය |
| Ⓢ | අන්තර්ජාලයේ පවතින පරිගණකයක් අනන්‍යව හඳුනාගැනීමට භාවිත වේ. |

**පද ලැයිස්තුව :** {FTP, SMTP, URL, IP ලිපිනය, IaaS, Trash, Draft, SaaS}

14. අ.පො.ස. (සා.පෙළ)- 2021 (4- i)

(i) (a) හා (b) ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත දී ඇති පද ලැයිස්තුව භාවිත කරන්න,

**පද ලැයිස්තුව :**

{මොසිල්ලා ෆයර් ෆොක්ස් (Mozilla Firefox), ගූගල් (Google), laaS, HTTP, පැස්කල් (Pascal), PHP, ට්විටර් (Twitter), වර්ඩ්ප්‍රෙස් (WordPress), ජූම්ලා (Joomla), ඉන්ටනෙට් එක්ස්ප්ලෝරර් (Internet Explorer)}

(a) A - D තෙක් ලේබල මගින් පෙන්වා ඇති විස්තර ඉහත දක්වා ඇති පද ලැයිස්තුවේ ඇති නිවැරදි පද හා ගලපන්න. එක් එක් ලේබලය ඉදිරියෙන් එයට ගැලපෙන පදය, **ලේබලය →පදය** යන ආකාරයෙන් ලියා දක්වන්න.

| ලේබලය | විස්තරය |
|---|---|
| A | සෙවුම් යන්ත්‍රයකි. |
| B | අන්තර්ජාල සේවා නියමාවලියකි. |
| C | ගතික වෙබ් සංවර්ධනය සඳහා සුලබව භාවිත කරනු ලබන ක්‍රමලේඛ භාෂාවකි. |
| D | සමාජ ජාලයකි. |

(c) P – S දක්වා වූ ලේබල සහිත එක් එක් හිස්තැන පිරවීම සඳහා වඩාත්ම යෝග්‍ය වූ පදය ඉහත දී ඇති පද ලැයිස්තුවෙන් හඳුනාගෙන එක් එක් හිස්තැන් ලේබලය ඉදිරියෙන් අදාළ පදය, **ලේබලය →පදය** යන ආකාරයෙන් ලියා දක්වන්න.

(1) ...........P.............හා .............Q................ .ආකාරයේ වූ සන්ධාර කළමනාකරණ පද්ධති (CMS) භාවිත කර වෙබ් පිටු සංවර්ධනය කළ හැකි ය.

(2) ..............R................හෝ ..........S.................. වැනි වෙබ් අතරික්සුවක් භාවිතයෙන් පොදු ජනයාට වෙබ් අඩවියකට පිවිසිය හැකි ය.

15. අ.පො.ස. (සා.පෙළ)- 2022 (5 වන ප්‍රශ්නය)

(i) P සිට S තෙක් ඇති ලේබල මගින් දක්වන විස්තර පහත දී ඇති ලැයිස්තුවේ නිවැරදි පද හා ගළපන්න. එක් එක් ලේබලය ඉදිරියෙන් එයට ගැළපෙන පදය, **ලේබලය → පදය** යන ආකාරයෙන් ලියා දක්වන්න.

| ලේබලය | විස්තරය |
|---|---|
| P | වෙබ් සේවාදායකයක් (web server) සහ වෙබ් සේවාලාභියෙක් (web client) අතර සන්නිවේදනයට භාවිත වේ. |
| Q | වෙබ් සේවාදායකයක ඇති වෙබ් පිටුවක් අනන්‍යව හඳුනා ගැනීමට භාවිත වේ. |
| R | අන්තර්ජාලයේ ඇති පරිගණකයක් අනන්‍යව හඳුනා ගැනීමට භාවිත වේ. |
| S | ඊ-තැපැල් සේවාදායක දෙකක් අතර ඊ-තැපැල් හුවමාරුවට භාවිත වේ. |

**පද ලැයිස්තුව :** {DNS, ඊ-ලිපිනය, FTP, HTTP, අධි සන්ධානය, IP ලිපිනය, SMTP, URL}

(ii) පහත **A** සිට **G** තෙක් ලේබල් කළ එක් එක් අයිතමයට ගැළපෙන නිවැරදි නිදසුන, දී ඇති නිදසුන් ලැයිස්තුවෙන් තෝරාගෙන **ලේබලය → නිදසුන** ආකාරයට ලියන්න.

**A** – සන්ධාර කළමනාකරණ පද්ධතියක් (Content Management System)
**B** – ඉහළ මට්ටමේ වසම් නාමයක් (Top level domain name)
**C** – වෙබ් අතරික්සුවක් (Web browser)
**D** – සෙවුම් යන්ත්‍රයක් (Search engine)
**E** – සමාජ ජාලයක් (Social network)
**F** – වලාකුළු පරිගණන සේවාවක් (Cloud computing service)
**G** – වෙබ් පිටු ගොඩනැගීමට භාවිත කරන ක්‍රම ලේඛන භාෂාවක් (Programming language used for web page development)

**ලැයිස්තුව :** {.lk, ෆයර්ෆොක්ස් (Firefox), ගූගල් (Google), IaaS, Pascal, PHP, ට්විටර් (Twitter), වර්ඩ් ප්‍රෙස් (Word Press), www.nie.lk}

## පිළිතුරු

1. අ.පො.ස. (සා.පෙළ) 2016 (1-iii)

   (a) කාර්ය සාධනය වැඩි දියුණු වීම/නඩත්තු ගැටළු අවම වීම/ආරක්ෂාව ඉහළ වීම/විශ්වශ්‍යතාව/ඕනෑම ස්ථානයක දී හා ඕනෑම වේලාවක දී ප්‍රවේශ වීමේ පහසුව

   (b) නොකඩවා පවතින අන්තර්ජාල පහසුකම් අවශ්‍ය වීම/තුන් වන පාර්ශවයක් මත යැපීමට සිදු වීම /ආරක්ෂාමය ගැටළු/ පෞද්ගලිකත්වය ගැටළු

2. අ.පො.ස. (සා.පෙළ) 2016 (1-vii)

   P – WWW Q – FTP R – DNS S – HTTP

3. අ.පො.ස. (සා.පෙළ) 2016 (6 -ii)

   (a) කාලය ඉතිරිවීම/ ගමනාගමන වියදම් ඉතිරි වීම

   (b) මුහුණට මුහුණ අන්තර්ක්‍රියා නොමැති වීම/අන්තර්ජාල පහසුකම් අවශ්‍ය වීම/ඉහළ ආරම්භක සහ/හෝ නඩත්තු වියදම්/තාක්ෂණික සහය අවශ්‍ය වීම

   (c) Email (වඩාත් ගැලපේ), අනෙකුත් විකල්ප: Skype, Viber, WhatsApp

   (d) Social media/ SMS/ Wikis/ forums/ online chatting/ tele-conferencing/ instant Messaging

4. අ.පො.ස. (සා.පෙළ) 2017 (1-vii)

   1 - True/T (සත්‍ය)
   2 - True/T (සත්‍ය)
   3 - True/T (සත්‍ය)
   4 – False/F (අසත්‍ය) (ලකුණු 2)

5. අ.පො.ස. (සා.පෙළ)- 2017 (6 – ii )

   1 → F
   2 → A
   6 → C
   (ලකුණු 3)

6. අ.පො.ස. (සා.පෙළ) 2018 (1-vi)

   A→Z
   B→X
   C→Y
   (ලකුණු 2)

7. අ.පො.ස. (සා.පෙළ)- 2018 (1-vii)

   S1 → වීඩියෝ සම්මන්ත්‍රණ /Video Conferencing
   S2 → විද්‍යුත් තැපැල / email
   S3 → ක්ෂණික පණිවුඩ යැවීම / Instant Messaging
   S4 → සමාජ ජාල /Social Networks (ලකුණු 2)

8. අ.පො.ස. (සා.පෙළ)- 2018 (3-ii)

(a)

P→ නියමාවලිය protocol
Q→ ලෝක විසිරි වියමන world wide web
R→ වසම් නාමය domain name
S→ ඉහළ මට්ටමේ වසම්/ top level domain
T→ සම්පතට මග/ path to resource
U→ සම්පත/ resource
V→ ඒකාකාර සම්පත් නිශ්චායක /Uniform resource locator/URL (ලකුණු 3.5)

(b) A ⟶ වෙබ් සේවා දායකය /web server
B ⟶ IP ලිපිනය /IP Address
C ⟶ තැපැල් සේවා දායකය /Mai Server
D ⟶ ආවයන තැපෑල /Spam mail (ලකුණු 2)

9. අ.පො.ස. (සා.පෙළ)- 2019 (1-x)

(ලකුණු 2)

A – T, B – F (ලකුණු 2)

10. අ.පො.ස. (සා.පෙළ)- 2019 (2-iii)

(a) මුරපදයක් භාවිතා කිරීම (පරිගණක ගිණුමට/පැතුරුම්පතට) (ලකුණු 1)

(b)
- විවෘත මූල පැතුරුම් පතක්/ ලිබ්රෙඕෆිස් කැල්ක්/ ඕපන් ඕෆිස් කැල්ක් මෘදුකාංග ස්ථාපනය (ලකුණු 1)
- නොමිලේ පවතින වලාකුළු ආධාරක පැතුරුම් පතක් / Google sheets මෘදුකාංගය භාවිතය // වලාකුළු පරිගණනය භාවිතය

(d)
- හිමිකම් ඇති පුද්ගලයාගේ නම සඳහන් කිරීම සහ ඔහුගේ හෝ ඇයගේ තොරතුරු ලබාදීම
- පෙරලි කොමා භාවිතය සහ හිමිකම ඇති පුද්ගලයාගේ තොරතු ලබාදීම
- තොරතුරු ලබාගත් මූල සම්පත් ලැයිස්තුගත කිරීම (ලකුණු 1)
- කර්තෘගේ නිසි අවසරය ලබා ගැනීම (සහ එය සඳහන් කිරීම )

(e) (ලකුණු 2)

- බහුමාධ්‍ය පරිගණකය / උකුළ පරිගණකය **සහ** සන්නිවේදන මෘදුකාංග **සහ** අන්තර්ජාලය
- ශ්‍රව්‍ය ආධාංග සහිත පරිගණකය **සහ** වෙබ් කැමරාව **සහ** සන්නිවේදන මෘදුකාංග **සහ** අන්තර්ජාලය
- වීඩියෝ සම්මන්ත්‍රණ කට්ටලය **සහ** අන්තර්ජාලය

11. අ.පො.ස. (සා.පෙළ)- 2019 (4 - i)

(ලකුණු 3)

A – DNS සේවාව, B – FTP, C – SMTP, D – lk, E – සෙවුම් යන්ත්‍ර, F – @

12. අ.පො.ස. (සා.පෙළ)- 2020 (4 - i, ii)

(i) මෘදුකාංග පිරිවැය අඩුකර ගැනීම
මෘදුකාංග නඩත්තුව පහසුවීම
එසැනින් යවත්කාලීන කිරීම් ලැබීම

(ලකුණු 2)

(ලකුණු 2)

(ii) P - IP ලිපිනය, Q – Hyperlink, R - DNS, S - HTTP

13. අ.පො.ස. (සා.පෙළ)- 2021 (1- vii)

P → SMTP
Q → SaaS
R → Draft
S → IP ලිපිනය

(ලකුණු 2)

14. අ.පො.ස. (සා.පෙළ)- 2021 (4- i)

(a)

A → ගූගල්
B → HTTP
C → PHP
D → ටවිටර්

(ලකුණු 2)

(b) පහත පිළිතුරු හතර අතුරින් ඕනෑම එකක් :

| 1 වෙනි පිළිතුර | 2 වෙනි පිළිතුර | 3 වෙනි පිළිතුර | 4 වෙනි පිළිතුර |
|---|---|---|---|
| P :වඩර් ප්‍රෙස් | P:ජූම්ලා | P: වඩර් ප්‍රෙස් | P:ජූම්ලා |
| Q: ජූම්ලා | Q: වඩර් ප්‍රෙස් | Q: ජූම්ලා | Q: වඩර් ප්‍රෙස් |
| R: මොසිල්ලා ෆයර් ෆොක්ස් | R: මොසිල්ලා ෆයර් ෆොක්ස් | R: ඉන්ටනෙට් එක්ස්ප්ලෝර | R: ඉන්ටනෙට් එක්ස්ප්ලෝර |
| S: ඉන්ටනෙට් එක්ස්ප්ලෝර | S: ඉන්ටනෙට් එක්ස්ප්ලෝර | S: මොසිල්ලා ෆයර් ෆොක්ස් | S: මොසිල්ලා ෆයර් ෆොක්ස් |

[ලකුණු 0.5 x 4= ලකුණු 2]

15. අ.පො.ස. (සා.පෙළ)- 2022 (5 වන ප්‍රශ්නය)

(i) P – HTTP Q – URL R – IP ලිපිනය/ IP Address S – SMTP

(ලකුණු 0.5 x 4 = 2)

(ii) A – වර්ඩ් ප්‍රෙස් /Word Press B – .lk/lk C – ෆයර්ෆොක්ස්/ Firefox
D – ගූගල්/Google E – ටවිටර්/Twitter F – Iaas
G – PHP

(හතම නිවැරදි නම් ල.2, හයක් නිවැරදි නම් ල.1.5, 4-5 ක් නිවැරදි නම් ල.1 ක් 2-3 ක් නිවැරදි නම් ල. 0.5 ක් 1 ක් නිවැරදි නම් ලකුණු නැත.)